| Publication: Daily Divaina | Date: 09-Apr-20 |
| --- | --- |
| Page No: 5 | Section: Business |


# කොරෝනා මැඩලීමේ රජයේ වැඩපිළිවෙළට උපරිමයෙන්ම සහාය දක්වනවා

## පුද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය කියයි

කොරෝනා වයිරස් වසංගතය පවතින මෙම තීරණාත්මක කාල පරිච්ඡේදයේදී සිය සංගමය රටේ සෞඛ්‍ය සේවා වෙනුවෙන් සම්පූර්ණයෙන් කැපවී සිටින බවත් ඒ සඳහා අඛණ්ඩව දායකත්වය ලබා දෙන බවත් පුද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය (APHNH) මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් පවසයි. මෙම වසංගතයට එරෙහි සටන ජයගැනීමට එම වෛරසය පැතිරීම, රෝග විනිශ්චය හා ප්‍රතිකාර ආදිය සම්බන්ධයෙන් රජය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ගෙන ඇති නියෝග අඛණ්ඩව ඉතා උනන්දුවෙන් අනුගමනය කරනු ඇත. සෞඛ්‍යය අත්‍යවශ්‍ය සේවාවක් වන අතර රෝගීන් අපේක්ෂා කරන ආකාරයේ සත්කාර මට්ටමක් සහතික කරමින් පුද්ගලික රෝහල් පැය 24 පුරාම ක්‍රියාත්මක වේ. ඔවුන්ගේ හදිසි සේවා හා අනෙකුත් බාහිර හා නේවාසික සායනික පහසුකම් සාමාන්‍ය පරිදි සේවාවන් අඛණ්ඩව සපයනු ඇති අතර රජය මේ වන විට COVID-19 ආසාදිත රෝගීන්ට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති නිසා එමගින් රජයේ සෞඛ්‍ය අංශයට ඇති වැඩ ප්‍රමාණය අවම කර ගත හැකි බව පුද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය අවධාරණය කරයි.

මෙවැනි පීඩාකාරී හා අභියෝගාත්මක කාලවලදී රජය විසින් පත් කර ඇති කොරෝනා වයිරසය වැළැක්වීමේ කාර්ය සාධක බලකායේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රයත්නයට සහයෝගය දක්වන බව හා එයට ප්‍රශංසා කරන බව ද සංගමය නැවත අවධාරණය කරමින් පවසයි.

ADFACTORS PR
Knowledge-driven communications